## කළුතර නගර සභාව
## කළුතර දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 08 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

#### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කළුතර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

##### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ඉදිරි වර්ෂය සඳහා 2014 වර්ෂයේදී ගෙවා තිබූ රු. 505,373 ක් වූ (වියදම්) ඉදිරි ගෙවීම් සඳහා ගැලපීම් මූල්‍ය ප්‍රකාශන වල සිදු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාල සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ කඩකුලී රු.28,600 ක් හා වරිපනම් බදු රු.753,227 ක් කලින් ලැබීම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ පුස්තකාල පොත් රු. 108,537 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාල එකතුව රු.352,348 ක් වූ වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේ ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

##### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) පුස්තකාල පොත්, ලීබඩු හා උපකරණ, මෝටර් රථ හා කරත්ත, යන්ත්‍ර හා උපකරණ යටතේ දක්වා තිබූ 1994 ට පෙර සිට පැවත එන එකතුව රු.6,526,163 ක් වූ ස්ථාවර වත්කම් හඳුනාගෙන නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා අදාල උපලේඛන නොමැති වීම නිසා එකතුව රු.261,720,638 ක් වූ වත්කම් ශේෂ 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 2. මූල්‍ය සමාලෝචනය

#### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,778,582 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,278,832 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා/අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයට අදාල වූ වියදම් රු.2,740,213 ක්, වියදම් ණය හිමියන් ලෙස ඉකුත් වර්ෂයේදී ගිණුම් ගත කර නොතිබීම නිසා එම වියදම් 2014 වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගැලපීම් කර තිබුණි.

(ආ) 2002 වර්ෂයට පෙර කාල සීමාවලට අදාල වූ එකතුව රු.9,067,532 ක් හා රු.11,703,593 ක් වූ වත්කම් හා වගකීම් ශේෂ නිරවුල් කිරීමට හෝ අයකර ගැනීමට නොමැති ලෙස දක්වා සභා අනුමැතියකින් හෝ තොරව ගිණුම්වලින් කපා හැර තිබුණි.

(ඇ) සභාවේ පොදු මුදල් ගිණුමට (977) අදාලව නිකුත් කළ නමුත් විගණිත දිනය වූ 2015 ජූනි 05 දින වන විටත් ගෙවීමට ඉදිරිපත් නොවූ රු.54,735 ක් වූ චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) මිය ගිය හා සේවය හැර ගිය සේවකයන් 75 දෙනෙකු විසින් ලබාගෙන එහෙත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් අය වී නොමැති ණය ශේෂවල එකතුව රු.369,920 ක් විය.

(ඉ) විගණනය සඳහා ඉදිරිපත් වූ ණයගැති/ණයහිමි කාල විශ්ලේෂණය අනුව 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණයහිමියන්ගෙන් සියයට 56 ක් හෙවත් රු.20,619,409 ක් වසර 05 කට වඩා පැරණි ශේෂයන් වන අතර ණයගැතියන්ගෙන් සියයට 39 ක් හෙවත් රු. 16,259,744 ක් වසර 01 කට වඩා පැරණි ඒවා විය.

(ඊ) මග නැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් සිදු කර තිබූ මාර්ග ව්‍යාපෘති 2 ක් සඳහා ප්‍රතිපූර්ණ විය යුතු රු.810,383 ක් වූ වියදම් අදාල නියෝජිත ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබූ අතර ඒවා නැවත ඉදිරිපත් කර තිබුණද, 2015 ජූලි 06 වන විටත් අදාල මුදල් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 28,032 | 16,179 | 28,637 |
| (ii) බදු කුලී | 9,436 | 6,521 | 4,197 |
| (iii) බලපත්‍ර ගාස්තු | 235 | 213 | 34 |
| (iv) වෙනත් ආදායම් | 122,707 | 122,707 | -- |

2.3.2 **වරිපනම් බදු**

2014 දෙසැම්බර් 31 දිනට සමස්ථ වරිපනම් බදු හිඟය රු.27,614.261 ක් විය. මින් අවු.01 ට වැඩි කාලයකට අදාල රු.16,292,507 ක් වූ හිඟ ශේෂය වරිපනම් ඒකක 6751 කින් අයවිය යුතු විය.

2.3.3 **බලපත්‍ර ගාස්තු , කර්මාන්ත බදු, ව්‍යාපාර බදු**

2014 වර්ෂයට අදාලව ව්‍යාපාර ආයතන 38 කින් රු.37,500 ක් වූ වෙළඳ බලපත්‍ර ශේෂයද, ව්‍යාපාර 15 කින් රු. 15,975 ක කර්මාන්ත බදු ශේෂයක්ද, ව්‍යාපාර 239 කින් ව්‍යාපාර බදු රු.460,920 ක්ද 2015 මැයි 15 දින වන විටත් හිඟව පැවතුණි.

2.3.4 **<u>තානායම් කුලී</u>**

2015 පෙබරවාරි 12 දින වන විටත් අය වී නොතිබූ තානායම් කුලී අදායම රු.750,719 ක් විය.

2.3.5 **<u>දැන්වීම් පුවරු ආදායම්</u>**

2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.238,430 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු 2015 පෙබරවාරි 15 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 **<u>කඩකුලී</u>**

(අ) සභාව සතු කඩකාමර 36 කින් රු. 1,192,582 ක් වූ හිඟ කුලී ශේෂයක් 2015 අප්‍රේල් 20 දිනටත් හිඟව පැවතුණි.

(ආ) ඉහත කඩකාමරවල මාසික කුලිය සළකා බැලීමේදී හිඟ කුලී දල වශයෙන් මාස 3 සිට අවුරුදු 4 යි මාස 10 ක කාල පරාසයකට අදාල විය.

(ඇ) කඩකුලී සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී කඩකුලී, ගිවිසුම් 1993 න් පසු අත්සන් කර නොතිබුණු අතර ලිපිගොනුද 1993 න් පසු යාවත්කාලීන කර නොතිබුණි.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

**<u>පෙර පාසල් දරුවන්ගෙන් මුදල් අයකිරීම</u>**

සභාවේ පෙර පාසැලට ළමුන් ඇතුළත් කිරීමේදී සභාවේ කිසිදු අනුමැතියකින් තොරව එක් ළමයෙකුගෙන් රු.600 බැගින් 2013 වර්ෂයේදී රු.45,000 ක් අයකරගෙන තිබුණි. මෙම මුදල් අයකිරීම වර්ෂ ගණනාවකට පෙර සිට වාර්ෂිකව සිදු කරගෙන යන බවද අනාවරණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මෙම මුදල් කිසිදු බැංකු ගිණුමක තැන්පත් කර නොතිබූ අතර පෙර පාසැලේ දරුවෙකුගේ මවක භාරයේ රඳවාගෙන තිබුණි.

(ආ) මෙසේ අයකරගන්නා මුදල්, වර්ෂය අවසානයේ පැවැත්වෙන පෙර පාසැල් විවිධ ප්‍රසංගයේ ආහාර වියදම් හා වෙනත් සුළු වියදම් වෙනුවෙන් දරන බව අනාවරණය වුවද එම වියදම් සම්බන්ධව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොවුණි. විගණන පරීක්ෂාවෙන් සති 2 ½ කට පසු 2013 දෙසැම්බර් 12 දින සභාවේ පෙර පාසැල් පාලිකාව සහ මුදල් රඳවා තබාගෙන තිබූ මව විසින් රු.36,601 ක බිල්පත් විගණනයට ඉදිරිපත් කරන ලදී.

3.2 **<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඉටු කිරීමට සභා කර්මාන්ත 11 ක් අනුමත වී තිබුණද විගණිත දිනය වූ 2015 පෙබරවාරි 27 වන විටත් වැඩ අවසන් කර තිබුණේ කර්මාන්ත 3 ක පමණි.

(ආ) එම කර්මාන්ත 3, 2014 අගෝස්තු හා ඔක්තෝබර් මාසවල අවසන් කර තිබුණද, 2015 පෙබරවාරි 27 වන විටත් වැඩ නිම් වාර්තා සකස් කර නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 03 දින ගමින් ගමට දොරින් දොරට ව්‍යාපෘතිය යටතේ අනුමත වී තිබූ රු.2,950,000 ක් වූ ව්‍යාපෘති 3 ම ඉටු කර නොතිබුණි.

(ඈ) ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2013 වර්ෂයේ අවිච්ඡේද කර තිබූ රු.7,195,000 ක් වූ ව්‍යාපෘති 13 න්, 7 ක් පමණක් 2014 වර්ෂයේදී ඉටු කර තිබුණි. ව්‍යාපෘති 6 ක වැඩ 2015 පෙබරවාරි වන විට අතරමග නවතා දමා තිබුණි.

(ඉ) අතරමග නවතා දමා තිබූ ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 3 ක මාර්ග තලය සකස් කර ABC ගල් අතුරා තිබුණි.

(ඊ) එම මාර්ග 3 හි සහ තවත් මර්ග දෙකක් සඳහා සපයා තිබූ තුට්ටි ගල් මාර්ගවල පසෙක ගොඩගසා තිබුණි. මෙම ගල් මාස 8 කට පෙර මාර්ගය වෙත සැපයූ බව ප්‍රදේශවාසීන් විසින් ප්‍රකාශ කරන ලදී.

(උ) 2015 ජනවාරි 20 දිනැති අංක MPS/HYW/MNG/7/GEN/2015 දරණ මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ ලිපිය මගින් 2014 දෙසැම්බර් 31 දිනට පෙර ගිවිසුම් අත්සන් කර තිබූ වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘතිවල වැඩ අවසන් කර අදාල බිල්පත් 2015 පෙබරවාරි 13 ට පෙර ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද ඒ අනුව හෝ ඉහත මාර්ගවල වැඩ නිම කිරීමට පියවර ගෙන නොතිබුණි.

3.3 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

3.4 **<u>වාහන පාලනය</u>**

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1647(ආ) අනුව සභාව සතුව පවතින වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවත් 2008 වර්ෂයෙන් පසු එවැනි සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ආ) සභාවේ ලොරි රථයේ එන්ජිම රු.479,080 ක් වැය කර අළුත්වැඩියා කර 2015 ජනවාරි 21 දින සභාවට ගෙනැවිත් තිබූ අතර නැවත 2015 ජනවාරි 23 දින වන විට ගියර් පද්ධති අළුත්වැඩියා කළ යුතු තත්වයේ ඇති බව රියදුරු දන්වා තිබුණි. තවද, එන්ජිම අළුත්වැඩියා කිරීම වෙනුවෙන් සියයට 75 ක් හෙවත් රු.359,310 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

(ඇ) 2013 නොවැම්බර් 20 දින සිට ක්‍රියා විරහිතව තිබූ සභාවේ ගිනි නිවීමේ ඒකකයට අයත් වොල්වෝ රථය 2015 පෙබරවාරි 13 වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි.

(ඈ) 2014 වර්ෂය තුළ සභාව සතු වාහන අළුත්වැඩියාව සඳහා රු.2,610,532 ක් වැය කර තිබූ නමුත් එම කිසිදු අළුත්වැඩියාවක් ලොග් පොත්වල සටහන් කර නොතිබුණි.

(ඉ) සභාව සතු වාහනවල මයිලෝ මීටර් දීර්ඝ කාලයක සිට ක්‍රියා විරහිත වී තිබූ බව අනාවරණය විය.

(ඊ) 2014 වර්ෂයේ සභාව සතු සියළුම වාහන සඳහා ඉන්ධන ලීටර් 64986 ක් සඳහා රු.7,869,805 ක් වැය කර තිබුණි. මයිලෝ මීටරය ක්‍රියාවිරහිත වී තිබියදී ඉන්ධන නිකුත් කරන්නේ කුමන තහවුරුවක් යටතේද යන්න සහ ගමන් සඳහා දක්වා ඇති දුර ප්‍රමාණයන්ගේ නිවැරදිභාවය සම්බන්ධයෙන් ගැටළුකාරී විය.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැයකරණය
(ඈ) වියදම් පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) වාහන පාලනය
(ඌ) ව්‍යාපෘති පරිපාලනය